# බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ මෝස්තර සම්පාදක තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව

යොමු අංකය : කදෙ/බප/1/2/4/1/3 දිනය 2017.08.24

1.2 අමාත්‍යාංශය : බස්නාහිර පළාත් ධීවර,මාර්ග,ප්‍රවාහන,කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

: යොමු අංකය : - දිනය

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම

: යොමු අංකය : ඩීඑම්එස්/ඩී/පොදු/ 11-2 දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය

: යොමු අංකය : CSC/PTR/5/4/11 දිනය : 2017.10.31

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය

: යොමු අංකය : දිනය :

1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

: යොමු අංකය : WPC/PSC/ADM/16/4/156 දිනය : 2018.01.08

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

: යොමු අංකය : දිනය :

02. පත්කිරීමේ බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය : ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : [illegible]
දිනය : [illegible]

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණය

3.2 ශ්‍රේණි : II, I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය : කිසියම් පනතක් ආඥා පනතක් ප්‍රඥප්තියක් මඟින් නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ නියාමනය කිරීමේ / විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූද බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම් ලෙස අවශ්‍ය වන්නා වූ ද සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ,ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන/ආයතන ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ/තනතුරුවල ස්වභාවය : ස්ථිර , විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : රා.ප.ච.ලේ 3 / 2016 අනුව MN -5 -2016

5.2 වැටුප් පරිමාණය : රු 34,605/- 10 X 660 – 11 X 755 – 15 X 930 – 63,460/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| II | පියවර 01 | 34,605/- |
| I | පියවර 12 | 41,960/- |

**සටහන - උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී අංක 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුයි. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි බව පත්වීම් ලිපියේ සඳහන් කළ යුතුයි.**

06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| මෝස්තර සම්පාදක | II/I | 08 | • අත්යන්ත්‍ර රෙදිපිළි සඳහා පාරිභෝගිකයින් ආකර්ශණය කර ගත හැකි නව මෝස්තර සම්පාදනය<br>• එම මෝස්තර ජේෂ පරිපාලිකාවන් සහ උපදේශකයින් මගින් කාර්මිකාවන් වෙත හඳුන්වාදීම<br>• එම මෝස්තර අනුව අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයට දායක වීම<br>• රෙදිපිළි නිෂ්පාදනය කිරීමේදී එහි කටයුතු අධීක්ෂණය හා පසු විපරම් කිරීම<br>• මෝස්තර නිෂ්පාදනයට අවශ්‍ය නූල් වර්ණ ගැන්වීම පිළිබඳ නිර්දේශ ලබා දීම<br>• වර්ණ ගැන්වීමේ කටයුතු පිළිබඳ අධීක්ෂණය<br>• වාර්ෂික ප්‍රදර්ශන සඳහා නව නිර්මාණ බිහිකිරීම දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන ප්‍රචලිත කිරීමට දායකවීම<br>• අලෙවි කටයුතු ප්‍රවර්ධනයට දායකවීම<br>• මැටි ආශ්‍රිත කර්මාන්ත මධ්‍යස්ථානයන්ට අවශ්‍ය මෝස්තර නිර්මාණය<br>• එම මෝස්තර අනුව භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම<br>• මෝස්තර සම්පාදනය පිළිබඳ ජේෂ උපදේශක නිලධාරින් පුහුණු කිරීම<br>• මැටි ආශ්‍රිත භාණ්ඩ හා නව මෝස්තර නිෂ්පාදන නව දැනුම ලබාදීම<br>• මැටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම හා සුළු කර්මාන්ත කරුවන්ට දැනුම ලබාදීමේ අරමුණින් වාර්ෂික ප්‍රදර්ශන පැවැත්වීම<br>• මැටි ආශ්‍රිත කර්මාන්ත මුල්කරගෙන බස්නාහිර පළාත තුල අධ්‍යාපන වැඩමුළු පැවැත්වීමට දායකවීම |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 6-2/A2-/4/2/17
දිනය : 2-/5/4/4/19

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 08

(අනුමත තනතුරු සංඛ්‍යාව 08 වන නමුත් දැනට සිටින නිලධාරීන් 04 දෙනෙකුට පෞද්ගලික වනසේ සකස් කරනු ලබන උසස්කිරීමේ පරිපාටියක් වන බැවින් ඒකාබද්ධ තනතුරු 04 සේ සැලකේ)

07. බඳවා ගැනීමේ ක්‍රමය : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය<br>ලිඛිත පරීක්ෂණය<br>වෘත්තීය පරීක්ෂණය/<br>සහතික පාඨමාලා /<br>වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 01 ) |
| 2 වන කර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික (ඇමුණුම 02 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම : } පත්කිරීමේ බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින්
2 වන කාර්යක්ෂමතා කඩඉම } බලය පවරනු ලද නිලධාරියක් මගින්

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..............
දිනය : 2018.1.19

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගතයුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු සේවකයින් විසින් අදාල රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබාගත යුතුය |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධි විධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම : අදාළ නොවේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv උසස්වීමේ දිනට පූර්වාසන්න වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

v අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම

vi අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සපුරන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 03) අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව සේවා ගණයේ වසර 10ක් සම්පූර්ණ වන දිනය හෝ සුදුසුකම් ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස්කිරීම සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : G-04/IA.D....14/2/17
2015/1/19

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද ,බස්නාහිර පළාත් සභා මූල්‍ය රීතිවලට ද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවන ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින මෝස්තර සම්පාදක නිලධාරීන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ වැටුප් පරිවර්තන ක්‍රමවේදය අනුව පහත සඳහන් පරිදි මෝස්තර සම්පාදක නිලධාරී තනතුරේ II හා I ශ්‍රේණි වලට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එහෙත් අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවන අතර, අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය නොවෙනස්ව ක්‍රියාත්මකවේ. එසේම අනුරූපි වැටුප් පියවරක් හිමි වීම හේතුකොට ගෙන ඊළඟ ඉහළ වැටුප් පියවරේ තබනු නොලැබේ.

**මෝස්තර සම්පාදක තනතුරේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

i. මෝස්තර සම්පාදක තනතුරේ වසර දහයක (10) ට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.
ii. මෝස්තර සම්පාදක තනතුරේ වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණ ද තත්කාලීනව අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්ව නැති නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**මෝස්තර සම්පාදක තනතුරේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

i. මෝස්තර සම්පාදක තනතුරේ වසර දහයක (10) කට වැඩි සේවා කාලයක් සහිත තත්කාලීනව අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී ඇති නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සංලක්ෂය :

අන්තර්ග්‍රහණයෙන් අනතුරුව අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. මීට පෙර පැවති බඳවා ගැනීම් පරිපාටියේ කාර්යක්ෂමතා කඩඉම සමත් වී ඇති නිලධාරීන් මෙම පරිපාටිය යටතේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් වූවා සේ සලකනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...
දිනය : 2018/11/19

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධයෙන් ගැටළු පැන නැගුණු අවස්ථාවක දී හා / හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16. අර්ථ නිරූපණ

<u>සතුටුදායක සේවා කාලය</u> (i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින් ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද, පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක්ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

<u>සක්‍රිය සේවා කාලය</u> — සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

<u>නියමිත දිනට</u> — අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය. 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සකස් කළේ : ............
අත්සන
රංගා ජාගොඩගේ
(කළමනාකරණ සහකාර)

පරීක්ෂා කළේ : ....................
අත්සන
එස්.ජේ. ජයසිංහ
(සහකාර අධ්‍යක්ෂ)
එස්. ජේ. ජයසිංහ
සහකාර අධ්‍යක්ෂ
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 2017-08-24

අත්සන ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම : ඩී.එම්.එන්. චන්ද්‍රාදිත්‍ය
තනතුර : කර්මාන්ත අධ්‍යක්ෂ (බ.ප.)
නිලමුද්‍රාව
ඩී. එම්. එන්. චන්ද්‍රාදිත්‍ය
කර්මාන්ත අධ්‍යක්ෂ
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : CO/4/A.D.M/14/7/1/A1
දිනය : 2018/1/19

යොමු අංකය: 1/14/2/1

බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මෝස්තර සම්පාදක තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2017/09/11

අත්සන : ......................................
නම : ..............................................
ලේකම්,බස්නාහිර පළාත් ධීවර,මාර්ග,ප්‍රවාහන,කර්මාන්ත හා
ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය.
නිලමුද්‍රාව

කේ. චම්පා එන්. පෙරේරා
ලේකම්
පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස සහ ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන ...දිවිඳ අමාත්‍යාංශය, (බස්නාහිර පළාත)
අංක. 59, කඩුවෙල පාර, බත්තරමුල්ල.

යොමු අංකය: CSC /PTR/5/4/11

බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මෝස්තර සම්පාදක තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2017.10.31

අත්සන : ..........

නම : ..........

ප්‍රධාන ලේකම්,

බස්නාහිර පළාත

නිල මුද්‍රාව

එම්.ජී.බී. දයා සෙනරත්
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය: WPC/PSC/ADM/16/4/156

බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මෝස්තර සම්පාදක තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය 18.01.08

අත්සන : ..........

නම : ..........

ලේකම්

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

බස්නාහිර පළාත.

නිලමුද්‍රාව

එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : G-S/ADM/4/7/124
දිනය : 2018/01/19

යොමු අංකය: GOS/ADM/4/7/124

බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මෝස්තර සම්පාදක තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය 2018/01/19 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය 2018/01/19

අත්සන : ..........

නම : ..........

ආණ්ඩුකාර ලේකම්

බස්නාහිර පළාත.

නිලමුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

ඇමුණුම 01

**බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ මෝස්තර සම්පාදක තනතුරේ II වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත පරීක්ෂණය)**

1. විභාගයේ නම : බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ මෝස්තර සම්පාදක තනතුරේ II වන ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත පරීක්ෂණය)

2. විභාගය පිළිබඳ විස්තරය :

| විෂයය | කාලය | මුළු ලකුණු | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්ය පරිපාටිය හා බස්නාහිර පළාත් මූල්‍ය රීති | පැය 03 | 100 | 40 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය | පැය 03 | 100 | 40 |

3. පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින්
4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද : අවශ්‍යතාව පරිදි පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පරිපාටිය හා බස්නාහිර පළාත් මූල්‍ය රීති | I.බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේVII, XII, XIV, XXVII, XXVIII, XXXII පරිච්ඡේද<br>II දෙවන කාණ්ඩයේ : XLVII, XLVIII පරිච්ඡේද<br>III බස්නාහිර පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ V,VI, VII , හා X පරිච්ඡේදයේ 4 කොටස |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය | ➢ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි සංශෝධනයන් (13 වන සංශෝධනය)<br>➢ පළාත් සභා පරිපාලනය සම්බන්ධ තත්කාලීන විධිවිධාන<br>➢ බස්නාහිර පළාත් සභා ප්‍රඥප්ති හා රෙගුලාසි<br>සහ<br>විෂයය ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ උපදෙස් පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 6-5/AD/14/3/27
දිනය : 2018/1/15

සකස් කළේ : ..............................
අත්සන
රංගා ජාගොඩගේ
(කළමනාකරණ සහකාර)

පරීක්ෂා කළේ : ..............................
අත්සන
එස්.ජේ. ජයසිංහ
(සහකාර අධ්‍යක්ෂ)

එස්. ජේ. ජයසිංහ
සහකාර අධ්‍යක්ෂ
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
දිනය 2017-08-24

අත්සන ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම : ඩීඑම්.එන්. චන්ද්‍රාදිත්‍ය
තනතුර : කර්මාන්ත අධ්‍යක්ෂ (බ.ප.)
නිල මුද්‍රාව

ඩී. එම්. එන්. චන්ද්‍රාදිත්‍ය
කර්මාන්ත අධ්‍යක්ෂ
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)

ඇමුණුම 02

## බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ මෝස්තර සම්පාදක පළමු වන ශ්‍රේණිය සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත හා ප්‍රායෝගික)

1. විභාගයේ නම : බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ මෝස්තර සම්පාදක පළමු වන ශ්‍රේණිය සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ලිඛිත හා ප්‍රායෝගික)

2. විභාගය පිළිබඳ විස්තරය :

| විෂයය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ පරීක්ෂණය | පැ 02 යි | 100 | 40 |
| ප්‍රායෝගික පරීක්ෂණය | පැ 03යි | 100 | 40 |

3. පවත්වනු ලබන බලධරයා : පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද : අවශ්‍යතාව පරිදි පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ පරීක්ෂණය | ➢ කර්මාන්ත සංවර්ධනය හා ව්‍යාපෘති කළමනාකරණය<br>• කර්මාන්ත සංවර්ධනය හා පාරිසරික බලපෑම්<br>• ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති හඳුනා ගැනීම<br>• සැලසුම්කරණය හා උපාය මාර්ග<br>• |
| ප්‍රායෝගික පරීක්ෂණය | ➢ **න්‍යායාත්මක පේෂ කර්මාන්ත පිරිසැලසුම් නිර්මාණය**<br>ස්වභාවධර්මයෙන් නිර්මාණය වී ඇති කිසියම් නිර්මාණාත්මක වස්තුවක් (කොළ,මල්,සත්වයෙක් හෝ වෙනත් යමක්) පාදක කර ගෙන අත්යන්ත්‍ර රෙදිපිළි මගින් , එම වර්ණ හා හැඩතල උපයෝගි කර ගෙන නිර්මාණයක් කිරීම මගින් වෙළෙඳපලට ගැලපෙන රෙදිපිළි නිර්මාණය කිරීමට අපේක්ෂයා සතු දැනුම හා අවබෝධය මැන බැලීම අපේක්ෂා කෙරේ. |

| | |
|---|---|
| | ➤ න්‍යායාත්මක රතු මැටි හා පිහන් මැටි කර්මාන්තය<br>ස්වභාවධර්මයෙන් නිර්මාණය වී ඇති යම් දෙයක් (උදා: කොළ , මල්, වෙනත් යමක් ) පාදක කර ගෙන දළ සටහන් නිර්මාණය කිරීම, ඒ ඇසුරින් පරිමාණුකූලව ඇඳීම එයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැකසීම (රතුමැටි/සුදු මැටි) තමා දන්නා ශිල්ප ක්‍රමයක් භාවිතා කර එය නිර්මාණය කිරීම, අලංකරණය හා<br><br>භාවිතය, ප්‍රමිතිය , පිළිස්සීම හා නිමි භාණ්ඩයක් ලෙස ඉදිරිපත් කිරීම මගින් වෙළෙඳපොළට ගැලපෙන භාණ්ඩයක් නිර්මාණය කිරීමට අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය මැන බැලීම අපේක්ෂා කෙරේ. |

සකස් කළේ : ........................................
අත්සන
රංගා ජාගොඩගේ
(කළමනාකරණ සහකාර)

පරීක්ෂා කළේ : ........................................
අත්සන
එස්.ජේ. ජයසිංහ
(සහකාර අධ්‍යක්ෂ)

එස්. ජේ. ජයසිංහ
සහකාර අධ්‍යක්ෂ
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
දිනය 2017-08-24

අත්සන ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම : ඩීඑම්.එන්. චන්ද්‍රාදිත්‍ය
තනතුර : කර්මාන්ත අධ්‍යක්ෂ (බ.ප.)
නිල මුද්‍රාව

ඩී. එම්. එන්. චන්ද්‍රාදිත්‍ය
කර්මාන්ත අධ්‍යක්ෂ
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : Gov/LA 2-3/4/2/179
දිනය : 2-18/1/1/9

ඇමුණුම 03

**බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ මෝස්තර සම්පාදක ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය**

1. නිළධරයා පිළිබඳ තොරතුරු
    - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................
    - 1.2 හැඳුනුම්පත් අංකය : ..........................................................
    - 1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..........................................................
    - 1.4 අයත්වන සේවය හා තනතුර : ..........................................................
    - 1.5 අයත්වන සේවා ගණය සහ ශ්‍රේණිය : ..........................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු
    - 2.1 පත්වීම් දිනය : ..........................................................
    - 2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..........................................................
    - 2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

    - 2.4 සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාල තොරතුරු
    - 3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I
    - 3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව :
    - 3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද ? ඔව් / නැත
    - 3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය :
    - 3.3.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව්/නැත
    - 3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව්/නැත
      උසස්වීමට පූර්වාසන්න පස් වසර තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත
    - 3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත්............................ දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ II/I ශ්‍රේණියට උසස්වීමට අදාල සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

ගුරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 60/7/1/42/16/7/24
දිනය : 2015/1/19

දිනය : .....................

..............................................
නිලධරයාගේ අත්සන

5 <u>දෙපාර්තමේන්තු ප්‍රධානගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියළු තෙරතුරු සත්‍ය හා නිවැරදි බවත්,ඉහත නම සඳහන් .......................................................... .............................................. මහතා/මෙනවිය/මහත්මිය ..........................................................සේවා ගණයේ............................ ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සැහීමට පත්වෙමි.ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ..............................................
අත්ස න : ..............................................
දිනය : ..............................................
නිල මුද්‍රාව: ..............................................

6 <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත් ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම : ............................................
අත්සන : ............................................
දිනය : ............................................
නිල මුද්‍රාව: ............................................

7 <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්/ පත්වීම් බලධරයා</u> ,

ඉහත සඳහන් සියළු තෙරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ................................. මහතා/ මහත්මිය/ මෙනවිය .............. සේවා ශ්‍රේණියේ ................. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ......................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ............................................
අත් සන : ............................................
දිනය : ............................................
නිල මුද්‍රාව: ............................................
(පරිපාලන බලධරයා)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : G-5/1/AD-1/2/7/124
දිනය : 20..5/1/1/5